රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2016

මගේ අංකය : EST-1/RESCH/08/0023
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2016.06.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## **ආයතන සංග්‍රහයේ 1 වැනි පරිශිෂ්ටය සංශෝධනය කිරීම**

ආයතන සංග්‍රහයේ 1 වැනි පරිශිෂ්ටය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. ආයතන සංග්‍රහයේ 1 වැනි පරිශිෂ්ටයේ දැක්වෙන දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ ලැයිස්තුවේ මෑතක දී පිහිටුවන ලද දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ගේ තනතුරු නාමයන් සහ රජයේ ප්‍රතිපත්ති තීරණ මත වෙනස් කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නව තනතුරු නාමයන් ඇතුළත්ව නොමැති බැවින්, දැනට පවතින ආයතන සංග්‍රහයේ 1 වැනි පරිශිෂ්ටය අවශ්‍ය සංශෝධන ඇතුළත් කර ඇමුණුම 01 පරිදි සංශෝධනය කිරීමට 2016.05.10 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. ඉහත සංශෝධනය 2016.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

# 1 වැනි පරිශිෂ්ටය

| අනු අංකය | දෙපාර්තමේන්තුව | | ආයතන සංග්‍රහයේ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් |
|---|---|---|---|
| 01 | අග්‍රාමාත්‍ය කාර්යාලය | .. | අග්‍රාමාත්‍ය ලේකම් |
| 02 | අග්‍රාමාත්‍ය කාර්යාලය | .. | අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් * |
| 03 | අධිකරණ සේවා කොමිෂන් සභාව | .. | ලේකම් |
| 04 | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | .. | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් |
| 05 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | .. | අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් |
| 06 | අභියාචනාධිකරණය | .. | රෙජිස්ට්‍රාර් ** |
| 07 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | .. | අමාත්‍ය මණ්ඩල ලේකම් |
| 08 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | .. | අමාත්‍ය මණ්ඩල අතිරේක ලේකම් * |
| 09 | අමාත්‍යාංශ | .. | අමාත්‍යාංශ ලේකම් |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 11 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | .. | ආගමන හා විගමන පාලක ජනරාල් |
| 12 | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | .. | ආනයන හා අපනයන පාලක ජනරාල් |
| 13 | ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය | .. | ලේකම් |
| 14 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | .. | ආයුර්වේද කොමසාරිස් |
| 15 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | .. | ආහාර කොමසාරිස් |
| 16 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | .. | ඉඩම් කොමසාරිස් ජනරාල් |
| 17 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 18 | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | .. | හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් |
| 19 | කම්කරු දෙපාර්තමේන්තුව | .. | කම්කරු කොමසාරිස් ජනරාල් |
| 20 | කම්කරු විනිශ්චය සභා | .. | සභාපති |
| 21 | කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය | .. | කම්කරු විනිශ්චය සභා ලේකම් |
| 22 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව (මහා භාණ්ඩාගාරය) | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 23 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 24 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 25 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 26 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | .. | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් |
| 27 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ |
| 28 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 29 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 30 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | .. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් |
| 31 | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 32 | ජනාධිපති ලේකම් කාර්යාලය | .. | ජනාධිපති ලේකම් |

| අනු අංකය | දෙපාර්තමේන්තුව | | ආයතන සංග්‍රහයේ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් |
|---|---|---|---|
| 33 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | .. | ලේකම් |
| 34 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 35 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 36 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ |
| 37 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 38 | ජාතික පොලිස් කොමිෂන් සභාව | .. | ලේකම් |
| 39 | ජාතික ප්‍රජා ජලසම්පාදන දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 40 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | .. | ලේකම් |
| 41 | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 42 | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ |
| 43 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ |
| 44 | ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව | .. | ලේකම් |
| 45 | තක්සේරු දෙපාර්තමේන්තුව | .. | ප්‍රධාන තක්සේරුකරු |
| 46 | තැපැල් දෙපාර්තමේන්තුව | .. | තැපැල්පති |
| 47 | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව (මහා භාණ්ඩාගාරය) | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 48 | දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 49 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල | .. | දිස්ත්‍රික් ලේකම්/ දිසාපති |
| 50 | දිසා අධිකරණය | .. | දිසා විනිසුරු |
| 51 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | .. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 52 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 53 | නීති කටයුතු දෙපාර්තමේන්තුව (මහා භාණ්ඩාගාරය) | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 54 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | .. | නීති කෙටුම්පත් සම්පාදක |
| 55 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | .. | ලේකම් |
| 56 | නීතිපති දෙපාර්තමේන්තුව | .. | නීතිපති |
| 57 | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය | .. | සභාපති |
| 58 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | .. | කොමසාරිස් |
| 59 | පාර්ලිමේන්තු සභානායක කාර්යාලය | .. | සභානායක ලේකම් |
| 60 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | .. | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් |
| 61 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | .. | පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් |
| 62 | පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ |
| 63 | පොලිස් දෙපාර්තමේන්තුව | .. | පොලිස්පති |
| 64 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | .. | කොමසාරිස් |
| 65 | ප්‍රාථමික අධිකරණය | .. | ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 66 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | .. | බන්ධනාගාර කොමසාරිස් ජනරාල් |
| 67 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | .. | බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් |
| 68 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |

| අනු අංකය | දෙපාර්තමේන්තුව | | ආයතන සංග්‍රහයේ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් |
|---|---|---|---|
| 69 | මහාධිකරණය | .. | මහාධිකරණ විනිසුරු |
| 70 | මහා භාණ්ඩාගාරය | .. | භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් |
| 71 | මහා භාරකාර දෙපාර්තමේන්තුව | .. | මහා භාරකාර තැන |
| 72 | මහෙස්ත්‍රාත් උසාවි | .. | මහෙස්ත්‍රාත් |
| 73 | මැතිවරණ දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 74 | මැතිවරණ කොමිෂන් සභාව | .. | ලේකම් |
| 75 | මැනුම්පති දෙපාර්තමේන්තුව | .. | සර්වේ ජනරාල්/ මැනුම්පති |
| 76 | මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 77 | මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව | .. | මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ |
| 78 | මුදල් කොමිෂන් සභාව | .. | ලේකම් |
| 79 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ |
| 80 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | .. | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් |
| 81 | රජයේ කර්මාන්ත ශාලාව | .. | කර්මාන්ත ශාලීය ඉංජිනේරු |
| 82 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | .. | රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් |
| 83 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | .. | රජයේ මුද්‍රණාලයාධිපති |
| 84 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | .. | රජයේ රස පරීක්ෂක |
| 85 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 86 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 87 | රාජ්‍ය පරිපාලන | | |
| | ආයතන අංශය | .. | ආයතන අධ්‍යක්ෂ ජනරාල් |
| | ඒකාබද්ධ සේවා අංශය | .. | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් |
| | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය | .. | ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ |
| 88 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | .. | රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් |
| 89 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 90 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 91 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 92 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | .. | ලේකම් |
| 93 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | .. | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| 94 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | .. | වනජීවී අධ්‍යක්ෂ ජනරාල් |
| 95 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | .. | වන සංරක්ෂක ජනරාල් |
| 96 | වාණිජ දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 97 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | .. | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් |
| 98 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | .. | විගණකාධිපති |
| 99 | විගණන සේවා කොමිෂන් සභාව | .. | ලේකම් |
| 100 | විදේශයන්හි ශ්‍රී ලංකාණ්ඩුවේ දූත මණ්ඩල | .. | තානාපති/මහකොමසාරිස් |
| 101 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 102 | විපක්ෂ නායක කාර්යාලය | .. | ලේකම් |

| අනු අංකය | දෙපාර්තමේන්තුව | | ආයතන සංග්‍රහයේ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් |
|---|---|---|---|
| 103 | විභාග දෙපාර්තමේන්තුව | .. | විභාග කොමසාරිස් ජනරාල් |
| 104 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | .. | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් |
| 105 | වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 106 | වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 107 | වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යාලය | .. | වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් |
| 108 | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (මහා භාණ්ඩාගාරය) | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 109 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 110 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | .. | ගුවන් හමුදාපති |
| 111 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | .. | දුම්රිය සාමාන්‍යාධිකාරී |
| 112 | ශ්‍රී ලංකා නාවික හමුදාව | .. | නාවික හමුදාපති |
| 113 | ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාලය | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 114 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | .. | ලේකම් |
| 115 | ශ්‍රී ලංකා යුධ හමුදාව | .. | යුධ හමුදාපති |
| 116 | ශ්‍රී ලංකා රේගුව | .. | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 117 | ශ්‍රේෂ්ඨාධිකරණය | .. | රෙජිස්ට්‍රාර් ** |
| 118 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව (මහා භාණ්ඩාගාරය) | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 119 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ |
| 120 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 121 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | .. | සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් |
| 122 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ |
| 123 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | .. | සමූපකාර සංවර්ධන කොමසාරිස් |
| 124 | සමූපකාර සේවක කොමිෂන් සභාව | .. | ලේකම් |
| 125 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ ජනරාල් |
| 126 | සීමා නිර්ණය කොමිෂන් සභාව | .. | ලේකම් |
| 127 | සුරාබදු දෙපාර්තමේන්තුව | .. | සුරාබදු කොමසාරිස් ජනරාල් |
| 128 | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | .. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් * |
| 129 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | .. | අධ්‍යක්ෂ |

* අමාත්‍ය මණ්ඩලය විසින් පත් කිරීම් සඳහා පමණක් අදාළ වන සේ මෙම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ආයතන සංග්‍රහයේ 1 පරිශිෂ්ටයට ඇතුළත් කර ඇත.

** අදාළ දෙපාර්තමේන්තුවල කාර්යාල පරිපාලනය, මූල්‍ය කළමනාකරණය සහ වගවීම සම්බන්ධයෙන් පමණක් අදාළ වන සේ මෙම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ආයතන සංග්‍රහයේ 1 පරිශිෂ්ටයට ඇතුළත් කර ඇත.